# හොල්මනක් දුටුවෙමි



සිතුලි කුලංගනා පාඩිගම

කෘතියේ නම - හොල්මනක් දුටුවෙමි

කතෘගේ නම - සිතුලි කුලංගනා පාඩිගම

කතෘ අයිතිය ඇතුළු විස්තර -

සිතුලි කුලංගනා පාඩිගම
මහාමායා බාලිකා විදුහල
මහනුවර

පිට කවරය හා චිත්‍ර - සිතුලි කුලංගනා පාඩිගම

කතෘගේ වෙනත් කෘති -

ළමා කතාන්දර - හොඳ යහළුවෝ - 2019 ප්‍රථම මුද්‍රණය

හොඳ පාඩමක් - 2021 ප්‍රථම මුද්‍රණය

ළමා කවි - මගේ කවි පොත - 2021 ප්‍රථම මුද්‍රණය

කෘතිය පළ කරන දින - 2023 නොවැම්බර්

**ISBN : 978-624-206-749-0**

# පිදුම

නිතරම මට කරදර කරන,

මගේ ආදරණීය මල්ලී

සිතුල් තිනුර පාඬිගම ට.........

මේ පොත පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

''ස්රාස්.................ස්'' ''ස්රා..........ස්.................රා...ස්.''

අම්මෝ අදත් සද්දයක් ඇහෙනවා මට නම් හරිම බයයි.

දැන් ටික දවසක් ඉඳන් අපේ ගෙදර අමුතු අමුතු සද්ද වගයක් රෑ පුරාවට ඇහෙනවා කීප දවසක් මම හොඳට අහගෙන හිටියා.

''හොල්මනක් වත්ද?'' හැබැයි අම්මා නම් කියන්නේ හොල්මන් කියලා කවුරුත් නෑ කියලා.



''අනේ මන්දා,මොකක්ද මේ හැමදාම ඇහෙන සද්දේ, මේ වැඩේ හරි යන්නෙ නෑ  හොයලා බලන්න ඕනෑ'' මම හිතුවා,කෙහොම හරි මේ හොල්මන මගේ ඇස් දෙකෙන්ම බලා ගන්නවා කියලා.

මගේ අක්කා කෙනෙක් දවසක් කිව්වා,'' හොල්මන් එන්නේ යක්කු ගස් නඟින වෙලාවට  කියලා.'' දැන් ඉතින් යකා ගස් නඟින වේලාව බලන්නේ කොහොමද? මටත් තියෙන ප්‍රශ්න.''යකා ගස් නඟින්නේ කොහොමද? අර මම දැකලා තියෙන ගමේ පන්සලේ යකා වගේ ලොකු නම් මේ යකා කොහොමද ගහ උඩ ඉන්නේ? හපෝයි මේවාට උත්තර කොහෙන්ද?'' මම තනියම හිතුවා.



''අම්මා.......... අම්මා............පොඩ්ඩක් එන්නකෝ'' මම සියලු දේම දන්නවා කියලා හිතාන ඉන්න අම්මාට කතා කළා.

''ඇයි ළමයෝ, කෑ ගහන්නේ,.....මම වැඩක්නේ........., ඔයා එන්න මෙහාට'' අම්මා හැමදාම වගේ සැරෙන්ම කිව්වා.

''අම්මා යක්කු ගස් නඟින්නේ කොයි වෙලාවට ද?'' මම ඇහුවා.

''ආ.....ඒ පාර යකෙක් විතරයි මේ ගෙදරට අඩු වුණෝ.............'' දැක්කනේ අපේ අම්මා?

''අනේ.....කියන්නකෝ අම්මා''මම කිව්වා.

''රෑට අනේ......රෑට දවල්ට එන්නේ නෑ, ඔයාලගේ කෑ ගැහිල්ලට යකාත් බයයි එන්න''ඔන්න අම්මගේ උත්තරේ.



''ඇයි මේ යකා දවල්ට අපිට බයයි නම් රෑට බය නැත්තේ''

නියම යකෙක් නේ!'' මම තනියම හිතුවා.

මේ යකාගේ ප්‍රශ්නේ හින්දා, මගේ හොල්මන් සෙවීමේ ගවේශණයත්


නවතිනවා.ඉක්මනින්ම මේ හොල්මන හොයා ගන්න ඕනෑ.

ඔන්න මම දවසක් රෑ ඇහැරිලා ඉඳලා හොල්මන් හොයා ගන්න

හිතුවා.දැන් ඉතින් හැමෝම නිදාගන්න යනකල් ඉඳලා මම

හෙමිහිට ඇඳේ නිදාගෙන සද්දේ ඇහෙයිද බැලුවා. ටික වේලාවක්ම

කරුවලේ වටපිට බල බලා හිටියා.



''අද ඔයා ඉස්කෝලේ යන්නේ නැද්ද දුව? හොඳටම වෙලා ගිහින්............ කී සැරයක් කතා කරන්නද ළමයෝ..............නැගිටින්න'' අම්මා කෑ ගහනවා යන්තම් වගේ ඇහුණා.

''අයියෝ,ඒ කියන්නේ මට නින්ද ගිහින් හොල්මන් හොයන්න වෙන්නේ නෑ ඉතින්'' මම තනියම හිත හිතා ඉස්කෝලේ ගියා.

හවස ඉස්කෝලේ ඉවර වෙලා ගෙදර ආපු මම කල්පනා කළේ ''කොහොමද මේක කරන්නේ............?''

කොහොමද රෑ ඇහැරලා ඉන්නේ..?

අපේ පන්තියේ මැඩම් නම් කියනවා, ''ලොකු ලොකු විභාග කරනකොට අයියලා, අක්කලා වතුර බේසමේ කකුල් දාගෙන ඉන්නවා කියලා. ඒත් නිදාගෙන ඉන්න මම කොහොමද කකුල් දාන්නේ බේසමට? කමක් නෑ, කොහොමහරි ඇහැරලා ඉන්නවා'' මම හිතුවා.





ඔන්න ටික ටික රෑ වුණා.

''දුව අද නිදා ගන්නේ නැද්ද?'' අම්මා ඇහුවා.

''ටිකක් ඉඳලා එන්නම්, අම්මා'' මම කිව්වා. ඇහැරගෙන තනියම ඉන්න මට පොඩි බයකුත් තිබුණා.

''හොල්මන් ලයිට් දාලා තියෙනකොට එන්නේ නැති වෙයිද?''

ඔන්න තවත් ප්‍රශ්නයක්.ලයිට් නිවලා නම් මට ඉන්න බෑ, මම ඇඳට වෙලා ඇහැරගෙන ඉන්නවා මම හිතුවා.

අනික අම්මා කිව්වා,''යකත් අපිට බයයි කියලා''

එයා ගහට නැග්ගේ නැත්නම්, හොල්මන් එන එකකුත් නැති වෙයි.

මම ලයිට් නිවලා දුවගෙන ගිහින් ඇඳට නැග්ගා.

දැන් හරි,ඔන්න හොල්මන හොයාගන්න මෙහෙයුම

දැන් තමයි පටන් ගත්තේ.මම පොරවන රෙද්ද හොඳට ඔළුවේ

ඉඳන් වහගෙන ඇස්දෙක විතරක් ඇරගෙන  වටපිට ගැන හොඳ

සෝදිසියෙන් හිටියා.''ටක.......ටක.......'' මම එකපාරටම

ඇඳේ ඉඳගත්තා. අද නම් හරි, හොල්මන ඇවිත්. ඒත් වෙනදා

එන සද්දෙට වඩා වෙනස්........හොල්මනට තරහා ගිහින්ද?

මගේ මෙහෙයුම දැනගෙනද? එහෙම උනොත් ඉවරයි............''

මට ගොඩක් බය හිතුණා.



ගෙදර කුස්සියේ පැත්තෙන් පොඩි එළියකුත් පේනවා,''හොල්මන

ඒ පැත්තට ලයිට්ටිදාගෙන ගිහින්ද? බලමුකෝ..........''

මම හෙමින් හෙමින් රෙද්දකුත් ඔළුවේ ඉඳලා වහගෙන කාමරේ .

දොර ළඟට ගියා.''ක්රිස්.........ක්රිස්.......ඩොග්.........''


ඔන්න සද්දේ මේ පැත්තෙන් තමයි ඇහෙන්නේ'' මම කළුවරේම

එළියක් වැටිලා තියෙන කුස්සිය පැත්තට හෙමින් හෙමින් ගියා.

''බුදු අම්මෝ.......!'' එක්වරම කටහඬවල් දෙකක් ඇහුණා.

එකක් නම් මගේ එතකොට අනිත් කටහඬ?

මං බයට වැටුණු විදිහටම හිටියා.ඇස්වත් ඇරියේ නෑ.



''මොකද? ළමයෝ මේ වෙලා තියෙන්නේ මම හොඳටම බය වුණා.
උදේ පාන්දර සෙල්ලම් කරනවාද? මොනවා වෙලාද, දන්නේ නෑ
මේ ළමයා හොල්මන් කරනවාද?'' අම්මා ඇහුවා.
ඔන්න...........මං බය උන කෙනා. අපේ අම්මා.
''අම්මා මොකද මේ රෑ කරන්නේ, දැන් නිදාගෙනනේ හිටියේ.''
මම හිතුවා. ''අම්මා මොකද? මේ මහ රෑ කුස්සියේ කරන්නේ,
මාත් බය වුණානේ.''මේ සීතලේ දාඩිය පිහින ගමන්ම අම්මාට කිව්වා.
''හොඳ රෑ......තව ටිකකින් ඉස්කෝලේ යන්න ඕනී......''අම්මා කිව්වා.
''ඈ .........ඒ කියන්නේ දැන් උදේ වෙලාද?
මට නින්ද ගිහින්නේ........'' ඔන්න එදාත් හොල්මන අල්ලන
සෙල්ලම ඉවරයි.



දවස් කීපයක්ම ගියා. රෑට ඇහෙන සද්ද නම් ඉඳහිට ඇහුණා. සමහර දවසට මම ඇහුණේ නෑ වගේ හිටියා.ඒත් හොල්මන ගැන හොයන්න ඕනි කියලා නම් නිතරම හිතුවා.

.එක දවසක් රෑ මම නිදා ගන්න ගිහින් ටික වෙලාවකින් ''ඩොග්''ගාලා සද්දයක් ඇහුණා,මම නම් හිතුවේ හොරෙක් ගෙට පැනලා කියලා.නැත්නම් අර හොල්මන ඇවිත්ද?'' මට බය හිතුණා. අම්මාට කතා කරත් ඇහුණේ නෑ. ආපසු සැරයක් ඔළුවේ ඉඳන් රෙද්ද වහගෙන මම ඇස් දෙක තද කර ගත්තා.



පාන්දර මට ඇහැරුණා. හරිම රස්නෙයි. මුළු ඇඟම වේලිලා වගේ වතුර තිබහයි හොඳටම. දැන් නැගිටලා යන්න බයයි.

''අම්මා.......අම්මා........නැගිටින්නකෝ, මට වතුර ටිකක් ඕනි''.

මම අම්මාට කතා කරා. ඒත් අම්මා තද නින්දේ නිසා ඇහැරුණේ නෑ. දවසම මහන්සිවෙලා අද නිවාඩු නිසා අම්මා පාන්දරම නැගිට්ටෙත් නැහැ.''කමක් නෑ,මම නැගිටලා යනවා'' කියලා හිතලා හෙමින් හෙමින් ඇඳෙන් බැස්සා.




කළුවරේම ඉස්සරහට යනකොට මම දැක්කා දිලිසෙන වීදුරු බෝල දෙකක් හරිම එළියයි.කළුවරේ වුණත් කොළපාට ට දිලිසුණා.

බයට ආපසු එන්න හැදුවත් හොල්මන බලන්න ආසා හිතුණා.

එළිය වැටුණොත් හොල්මන පැනලා යයි, කියලා හිතුව නිසා ලයිට් දැම්මෙත් නෑ මම.

මෙන්න ඒ පාර එළිය එහාට මෙහාට වෙනවා.

කළුපාට ගුලියක් වගෙත් පේනවා. දැන් නම් හොඳටම බයයි දාඩියත් දැම්මා.



දැන් නම් හරි,මේ නම් හොල්මන තමයි. මම ලයිට් එකක් තියෙන තැනට හෙමින් හෙමින් ලං වුණා විතරයි.

''දඩාස්...................''ගාලා ලොකු සද්දයක් එක්කම මොකක්දෝ කළු පාටට ඡායාවක් උඩ ඉඳලා බඩුත් පෙරලාගෙන ආවා.මමත් කෑ ගහගෙනම ලයිට් දැම්මා. අම්මා, අප්පච්චි විතරක් නෙවෙයි වතුර ගහලාවත් ඇහැරවන්න බැරි මල්ලිත් නැගිටලා දුවගෙන ආවා.

''ඇයි,.......ඇයි මොකද වුණේ?......'' අම්මා වෙවුලන ගමන් ඇහුවා.

''හොල්මන........හොල්මන.......මම දැක්කා අතන ඉඳන් ආවා.'' මම කීවා.

''ආ..........අර යන්නේ හොල්මන පාඩුවේ.............''

අප්පච්චි ගණනකට නැතිව කීවා. අපි හැමෝම කලබල වෙලා ඒ පැත්ත බැලුවා. කළුම කළු බෝලයක් වගේ පූසෙක් ජනේලයේ හිඩැසකින් එළියට ගියා. එතකොට හැමදාම රෑට සද්ද කරලා ගේ ඇතුළේ හොල්මන් කරේ එයාද?

''අයියෝ ! මම බය වුණ තරමක්''

මම හැමෝටම ඇහෙන්න කිව්වා.

''ඔන්න ඔයා හැමදාම රෑ තිස්සේ නැගිටලා හොයපු හොල්මන

තමයි මේ ඉන්නේ,මෙන්න මේ පූස්තඩියා, තේරෙනවා නේද?

හොල්මන් කියලා දෙයක් නෑ කියලා, හැම හොල්මනක්ම

ඉන්නේ හිතේ. අපි හිතින් හිතුවොත් විතරයි හොල්මන් පේන්නේ.''

මගේ රහස් මෙහෙයුම ගැන දැන ගෙන සිටි

අම්මා පැහැදිලි කරලා දුන්නා.



# ස්තූතිය

හැමදාම මාගේ ජීවිතයට ආලෝකයක්

වන මාගේ ආදරණීය

මහාමායා විදුහල් මෑණියට......,

5-D පන්තියේ මාගේ ආදරණීය

හද්‍රා ගුරු මෑණියන්ට......,

මාගේ අම්මා, අප්පච්චි, මල්ලි ඇතුළු

මෙම පොත ලිවීමට මාව දිරිගැන් වූ,

උදව් කළ ඔබ හැමෝටම

බොහොමත්ම  පිං.....

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවතපොත පතට සමීප කරවීම හරහා අ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි

.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

9786242067490